# කැලණිය අධ්‍යාපන කලාපය

දෙවන වාර පරීක්ෂණය - 2018

**09 ශ්‍රේණිය** **පුරවැසි අධ්‍යාපනය - I** කාලය පැය 02 යි

නම: ........................................................................................ වි. අංකය: ............

- **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**
- **ප්‍රශ්න අංකය 1 සිට 10 දක්වා ප්‍රශ්න වල අදාළ පිළිතුර ට යටින් ඉරක් අදින්න**

1) 1863 දී වහලුන් ලෙස දුක්විඳි ජනතාවගේ සමාජ සුරක්ෂිතතාව ඇතිකළ ඇමරිකානු නායකයෙකි.
   1) ජොන් කෙනඩි 2) ඒබ්‍රහම් ලින්කන්
   3) ඩොනල්ඩ් ට්‍රම්ප් 4) ජෝජ් වොෂින්ටන්

2) සමාජ සුරක්ෂිතතාව ගොඩ නගා ගැනීම සඳහා අවශ්‍ය පසුබිම පුළුල් ලෙස සංවිධානය කරන සංවිධිත ආයතනයකි.
   1) පාසල 2) පවුල
   3) පොලීසිය 4) ආරක්ෂක හමුදාව

3) රටක් තවත් රටක් සමග හෝ රටවල් කිහිපයක් සමග හෝ සම්බන්ධවී කටයුතු කිරීමේදී බලපවත්වන නීතිය
   1) දේශීය නීතියයි. 2) සිවිල් නීතියයි.
   3) අන්තර් ජාතික නීතියයි 4) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතියයි.

4) රටක මූලික නීතිය මෙන්ම උත්තරීතර නීතිය ලෙස හඳුන්වන්නේ.
   1) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවයි 2) පාර්ලිමේන්තු අණපනත්
   3) අපරාධ නීතිය 4) සිවිල් නීතිය

5) ළමා හිංසනය හා අපචාර පිළිබඳ දැනුවත් කිරීම පිලිබඳ සෘජු දුරකථන අංකය
   1) 1919 2) 1929
   3) 1939 4) 1949

6) මිනිස් අවශ්‍යතා පහසුකර ගැනීම සඳහා යොදා ගනු ලබන ක්‍රමවේදවල ඇතිකරන වෙනස්කම්
   1) කාලීන වෙනස්කම් ය. 2) යාන්ත්‍රික වෙනස්කම් ය.
   3) තාක්ෂණික වෙනස්කම් ය. 4) කාර්මික වෙනස්කම් ය.

7) අනාගත පරපුරේ අවශ්‍යතා සඳහා සම්පත් ඉතිරිකර ගනිමින් වර්තමාන පරපුරේ අවශ්‍යතා සඳහා සම්පත් යොදගෙන සිදුකරන සංවර්ධනය.
   1) ආර්ථික සංවර්ධනයයි. 2) සමාජ සංවර්ධනයයි.
   3) මානව සංවර්ධනයයි. 4) තිරසාර සංවර්ධනයයි.

8) අන් අයට කරදරයක් නොවන අයුරින් නීත්‍යානුකූල මාර්ගවලින් ධනය උපයාගෙන ධාර්මිකව ජීවත්වීම
   1) යහ ජීවනයයි. 2) සහජීවනයයි.
   3) ජීවනෝපායයි 4) ස්ථිර ජීවනයයි.

9) අතීතයේදි සෘජු ප්‍රජාතන්ත්‍රවාදි ලක්ෂණ පදනම් කරගෙන පාලන කටයුතු කළ රාජ්‍යය වන්නේ
   1) ප්‍රංශය යි. 2) ඇතැන්ස්ය. 3) බ්‍රිතාන්‍යයි 4) ඉන්දියාවයි.

10) ශ්‍රී ලංකාවේ සර්වජන ඡන්ද බලය හිමි වයස් සීමාව අවු 21 සිට 18 දක්වා අඩුකරනු ලැබුණේ,
   1) 1931 වර්ෂයේදී ය.
   2) 1947 වර්ෂයේදී ය.
   3) 1958 වර්ෂයේදී ය.
   4) 1972 වර්ෂයේදී ය.

- **පහත අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවලට ''අ'' සහ ''ආ'' තීරු එකිනෙක ගලපා නිවැරදි පිළිතුරට යටින් ඉරක් අඳින්න.**

11)

| ''අ'' | ''ආ'' |
|---|---|
| 1. උතුරු පලාත | A බදුල්ල |
| 2. සබරගමු පලාත | B කළුතර |
| 3. ඌව පලාත | C කෑගල්ල |
| 4. බස්නාහිර පලාත | D වවුනියාව |

I) DCBA II) DCAB III) CDAB IV) ABCD

12)

| ''අ'' | ''ආ'' |
|---|---|
| 1. සීමිත ඡන්ද බලය හිමිවීම | A ඩොනමෝර් ආන්ඩුක්‍රමය |
| 2. සර්වජන ඡන්ද බලය ලැබීම | B ඉන්දියාව |
| 3. ද්විපක්ෂ ක්‍රමයක් පවතින රටකි. | C මැකලම් ආණ්ඩුක්‍රමය |
| 4. බහුපක්ෂ ක්‍රමයක් පවතින රටකි. | D එක්සත් රාජධානිය |

I) ACDB II) CABD III) BCAD IV) CADB

13)

| ''අ'' | ''ආ'' |
|---|---|
| 1. අධ්‍යාපනය | A ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍රය |
| 2. සෞඛ්‍ය | B සීටී ස්කෑනර් යන්ත්‍රය |
| 3. බැංකු | C අන්තර් ජාලය |
| 4. සන්නිවේදනය | D උඩිස් ප්‍රක්ෂේපන යන්ත්‍රය |

I) DBAC II) ABDC III) CDBA IV) CDAB

14)

| ''අ'' | ''ආ'' |
|---|---|
| 1. ''ධම්මෝ හවේ රක්ඛති ධර්මචාරි'' | A ශ්‍රී ලංකා යුධ හමුදාව |
| 2. ''පිතෘ භූමිය සඳහා'' | B ශ්‍රී ලංකා ගුවන් හමුදාව |
| 3. ''රට වට බැඳි රන් වැට'' | C ශ්‍රී ලංකා පොලිසිය |
| 4. ''සුරකිමු ලකඹර'' | D ශ්‍රී ලංකා නාවික හමුදාව |

I) CABD II) CADB III) ACDB IV) DACB

15)

| ''අ'' | ''ආ'' |
|---|---|
| 1. මිනිස් අයිතිවාසිකම් ආරක්ෂාකර දිම. | A සමථ මණ්ඩලය |
| 2. ළමා අපයෝජන සම්බන්ධ නෛතික මැදිහත් විම. | B අධධිරණය |
| 3. මානව හිමිකම් ආරක්ෂා කිරීම | C ළමා ආරක්‍ෂණ අධිකාරිය |
| 4. සුළු ආරවුල් විසදා ගැනීම | D මානව හිමිකම් කොමිසම |

I) BCAD II) DABC III) CBDA IV) BCDA

- **ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවලට නියමිත පිළිතුරු වරහන් තුළින් තෝරා හිස්තැන මත ලියන්න.**

16) පුද්ගලයකු සමාජයට හැඩ ගැසීමේ මූලික පුහුණුව ....................................... ලබාදේ.
(පවුලෙන් , පාසලෙන් , පංසලෙන්)

17) රජය වෙනුවෙන් නඩු පැවරීම සහ නඩුවලට පෙනීසිටීම සිදු කරනු ලබන්නේ ....................................... දෙපාර්තමේන්තුව මගිනි.
( නීතිපති, විගණකාධිපති. පොලිස්පති)

18) ආර්ථිකයක පවත්නා සම්පත් මිනිස් වුවමනා ඉටුකර ගත හැකි පරිදි වෙනස් කිරීම. ....................................... නම් වේ.
( පරිභෝජනය, බෙදාහැරීම, නිෂ්පාදනය)

19) සමාජයේ පවත්නා සියලුම රැකියා අවස්ථා....................................... ලෙස හැඳින්වේ.
( තනතුරු, වැඩ ලෝකය, ස්වය. රැකියා)

20) සමූපකාර ව්‍යාපාරයේ පියා ලෙස සැලකේන්නේ....................................... රොබට් ඕවන් මහතා ය.
( බ්‍රිතාන්‍ය ජාතික, ඇමරිකන් ජාතික, ප්‍රංශ ජාතික)

# පුරවැසි අධ්‍යාපනය - II

- පළමු ප්‍රශ්නයට පිළිතුරු ලිවීම **අනිවාර්ය** වේ.
- පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න **හතරකට** පිළිතුරු සපයන්න.
- පිළිතුරු ලිවිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව **පහකි**.

---

1) i) ඔබ පාසල අයත් පළාත් පාලන ආයතනය නම් කරන්න. (ලකුණු -2)

ii) එම පළාත් පාලන ආයතනයේ ප්‍රධාන විධායකයා නම් කරන්න. (ලකුණු -2)

iii) පලාත් පාලන ආයතනයක ප්‍රධානියා පත්කරනු ලබන ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු -2)

iv) ඔබ සඳහන් කර ඇති පළාත් පාලන ආයතනයට සම්බන්ධ මහජන නියෝජිතයකු විසින් ඔබ ප්‍රදේශයේ ඉටුකළ කාර්යයන් දෙකක් සඳහන් කරන්න. (ලකුණු -4)

v) පළාත් පාලන බල ප්‍රදේශයේ කැලි කසල බැහැර කිරීම සඳහා පළාත් පාලන ආයතනයට ඇති වගකීම් හා බලප්‍රදේශයේ ජීවත්වන්නකු ලෙස ඔබට ඇති වගකීම පහත සඳහන් පරිදි වගු ගත කරන්න. (ලකුණු -6)

| පළාත් පාලන ආයතනයට අයත් වගකීම් | සේවා ලාභීන්ගේ වගකීම් |
|---|---|
| 1) | |
| 2) | |
| 3) | |

2) i) සමාජ සුරක්ෂිතතාව ඉටුකිරීම සඳහා පිහිටුවා ඇති සමාජ සංවිධාන දෙකක් නම් කරන්න. (ලකුණු -2)

ii) සමාජ සංවිධාන හා ආයතන මගින් ඉටුකරනු ලබන කාර්යයන් හතරක් සඳහන් කරන්න. (ලකුණු -4)

iii) මධ්‍යසාර මත්ද්‍රව්‍ය භාවිතය සමාජ විරෝධී ක්‍රියා, විෂමාචාර වළක්වා ගැනීම සඳහා ක්‍රියාත්මක වන ආයතන දෙකක් සඳහන් කර ඉන් එකක කාර්යයන් විස්තර කරන්න. (ලකුණු -5)

3) i) තාක්ෂණය වෙනස් වීමත් සමග ඇතිවන සමාජ වෙනස්වීම් දෙකක් සඳහන් කරන්න. (ලකුණු -2)

ii) තාක්ෂණය වෙනස්වීම් නිසා ඇතිවන හිතකර බලපෑම් හතරක් ලියන්න. (ලකුණු -4)

iii) 'අළුත් අළුත් දෑ නොතකන ජාතිය ලොව නොනඟී' මේ ගැන ඔබේ අදහස ඉදිරිපත් කරන්න. (ලකුණු -5)

4) i) යෝග්‍ය තාක්ෂණය යොදා ගැනීමෙන් අත්කර ගත හැකි ප්‍රතිලාභ දෙකක් නම් කරන්න. (ලකුණු -2)

ii) තාක්ෂණයේ ඇතිවූ සීඝ්‍ර දියුණුවත් සමග කෘෂිකාර්මික අංශයේ ඇතිවූ නවීනතම වෙනස්කම් හතරක් සඳහන් කරන්න. (ලකුණු -4)

iii) 'තාක්ෂණික දියුණුවත් සමග කාර්මික අංශය තුළ බිහිවූ නව රැකියා දෙකක් විස්තර කරන්න. (ලකුණු -5)

5) i) වර්තමාන සමාජයේ 'සහජීවනය' අවශ්‍ය වීමට හේතු දෙක්ක සඳහන් කරන්න. (ලකුණු -2)

ii) ඔබ තුළ වර්ධනය කර ගත හැකි 'සහජීවන' ගුණාංග හතරක් නම් කරන්න. (ලකුණු -4)

iii) සමාජ සංවර්ධනය උදෙසා 'යහජීවනය' හා 'සහජීවනය' වැදගත්වන ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු -5)

6) i) ප්‍රජාතන්ත්‍රවාදී පාලනයේ මූලික ස්වරූප දෙක නම් කරන්න. (ලකුණු -2)

ii) ප්‍රජාතන්ත්‍රවාදයේ සාර්ථකත්වය තීරණය වීම කෙරෙහි බලපාන සාධක හතරක් ලියන්න. (ලකුණු -4)

iii) දේශපාලන පක්ෂයක කාර්යභාරය කරුණු දෙකක් ඇසුරින් විස්තර කරන්න. (ලකුණු -5)

7) i) ශ්‍රී ලංකාවේ වර්තමානයේ ඡන්ද ප්‍රකාශ කිරීමට ලැබෙන මැතිවරණ දෙකක් නම් කරන්න. (ලකුණු -2)

ii) ඡන්ද බලය ලබා ගැනීම සඳහා සපුරා ගත යුතු සුදුසුකම් හතරක් ලියන්න. (ලකුණු -4)

iii) ඡන්දය ප්‍රකාශ කිරීමේදී සැලකිලිමත් විය යුතු කරුණු දෙකක් විස්තර කරන්න. (ලකුණු -5)

3) i) රජය මගින් සපයනු ලබන පොදු සේවා දෙක්ක නම් කරන්න. (ලකුණු -2)

ii) එම පොදු සේවා සපයන ආයතන හා එම ආයතනවලින් ඉටුවිය යුතු යුතුකම් හා වගකීම් පහත සඳහන් පරිදි සටහන් කරන්න. (ලකුණු -4)

| පොදු සේවාව | සපයන ආයතනය | ආයතන තුළින් ඉටුවිය යුතු යුතුකම් හා වගකීම් |
|---|---|---|
| 1 | | |
| 2 | | |

iii) ඔබ ප්‍රයෝජනයට ගන්නා පොදු සේවා දෙකක් සඳහන් කර ඒවා ප්‍රයෝජනයට ගන්නා ආකාරය කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු -5)

4) i) පවුලක් තුළ දැකිය හැකි ප්‍රජාතන්ත්‍රවාදී ලක්‍ෂණ දෙක්ක ලියන්න. (ලකුණු -2)

ii) පවුලක් තුළ සාමාජිකයින් සමගියෙන් කටයුතු කරනු ලබන අවස්ථා හතරක් ලියන්න. (ලකුණු -2)

iii) නිවසක් තුළ සාමකාමී පරිසයක් පැවතීම ඔබේ දියුණුවට හේතුවේ. විස්තර කරන්න. (ලකුණු -2)

5) i) පාසල තුළ නායකත්ව ලක්‍ෂණ දැකිය හැකි අවස්ථා දෙකක් ලියන්න. (ලකුණු -2)

ii) නායකයකු සතුවිය යුතු ගුණාංග හතරක් ලියන්න. (ලකුණු -4)

iii) යහපත් පුරවැසියකු ලෙස ජීවත්වීමට ප්‍රජාතන්ත්‍රවාදී ගුණාංග තම ජීවන පුරුදු බවට පත්කර ගත යුතුය. කරුණු දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු -5)

6) i) ශ්‍රී ලංකාවේ වෙසෙන ජනවර්ග දෙකක් ලියන්න. (ලකුණු -2)

ii) බහු සංස්කෘතික ජන සමාජයක ලක්‍ෂණ හතරක් ලියන්න. (ලකුණු -4)

iii) ශ්‍රී ලංකාව බහු සංස්කෘතික ජන සමාජයකි. මෙම සමාජයේ ජීවත් විමේදී ප්‍රගුණ කළ යුතු ගුණාංග දෙකක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු -5)

7) i) ස්වභාවික විපත් දෙකක් නම් කරන්න. (ලකුණු -2)

ii) මිනිස් ක්‍රියාකාරකම් නිසා ඇතිවන විපත් හතරක් ලියන්න. (ලකුණු -4)

iii) අපේ පැරණි මුතුන් මිත්තන් එදිනෙදා ජීවිතයේදී බොහෝ කටයුතු ඉටුකර ගැනීමේදී 'තිරසර සංවර්ධන' සංකල්පය අනුව කටයුතු කර ඇත. උදාහරණ දෙකක් මගින් පැහැදිලි කරන්න. (ලකුණු -5)